# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2258/14 - 2021 දෙසැම්බර් මස 14 වැනි අඟහරුවාදා - 2021.12.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 2/1976 (iv)

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත**

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද නියෝගය.

ජයම්පති මොල්ලිගොඩ,
සභාපති,
ශ්‍රී ලංකා තේ මණ්ඩලය.

2020 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2010 දෙසැම්බර් මස 17 වැනි දිනැති අංක 1684/48 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද, 2010 අංක 3 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල (වගාවන්, වතු සහ කුඩා වතු සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම) නියෝග, ඒ යටතේ කරන ලද කිසිවකට අගතියක් නොමැතිව මෙය *ගැසට්* පත්‍රයේ පළ කළ දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

EOG 12-0135/1

එල්.ඩී.බී. 44/1957 (iii)

**1957 අංක 51 දරන තේ පාලන පනත**

1957 අංක 51 දරන තේ පාලන පනතේ 11අ, 11ආ සහ 11ඇ වගන්ති සමඟ කියවිය යුතු එම පනතේ 49 වැනි වගන්තිය යටතේ වැවිලි අමාත්‍යවරයා විසින් සාදන ලද සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද නියෝග.

වෛද්‍ය **රමේෂ් පතිරණ** (පා. ම.),
වැවිලි අමාත්‍ය.

2021 මාර්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග, 2021 අංක 01 දරන තේ පාලන (වතු සහ කුඩා වතු සංවර්ධනය කිරීමේ සහ නඩත්තු කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. තේ වගා කිරීමෙහි නිරත වී සිටින වතු සහ කුඩා වතු අයිතිකරුවන්ට මෙම නියෝග අදාළ කරගත යුතු වේ.

3. 2 වන නියෝගයෙහි විධිවිධාන අදාළ වන සහ තේ වගා කිරීමෙහි නිරත වන සෑම තැනැත්තකු විසින්ම, යම් වත්තක් හෝ කුඩා වත්තක්, කොමසාරිස්වරයා විසින් කලින් කල නිශ්චය කළ යුතු, නියමිත නිෂ්පාදන සහ කළමනාකරණ ප්‍රමිතියකට සංවර්ධනය කළ යුතු ය.

4. වත්තක් හෝ කුඩා වත්තක් නියමිත නිෂ්පාදන සහ කළමනාකරණ ප්‍රමිතියට සංවර්ධනය සහ නඩත්තු කරනු ලබන්නේ ද යන්න නිශ්චය කිරීමේ දී කොමසාරිස්වරයා විසින් වෙනත් කරුණු අතර පහත සඳහන් දෑ සැලකිල්ලට ගනු ලැබිය යුතු ය ඃ

(අ) එහි නිෂ්පාදනය කරනු ලබන තේ ප්‍රමාණය සහ ගුණාත්මකභාවය;

(ආ) ඉහළ එලදාවක් සහතික කිරීම සඳහා, තේ පර්යේෂණ මණ්ඩලය විසින් නිර්දේශ කරන ලද ප්‍රමාණයන් සහ වාර ගණන අනුව, එයට ප්‍රමාණවත් පරිදි පොහොර යොදා ඇති ද යන වග;

(ඇ) නිර්දේශිත සියයට දෙකක (2%) වාර්ෂික ප්‍රමාණය පවත්වා ගනිමින් අනුමත ක්ලෝනවල ඉහළ එලදාවක් ගෙනදෙන වර්ගයන් නැවත වගා කිරීම සිදු කරනු ලැබ ඇත්තේ ද යන වග;

(ඈ) කාණු සහ හෙල්මළු නිසි පරිදි සකස් කිරීම, තේ පැළ පාළු සිටුවීම, කෘමි උවදුරු සහ රෝග පාලනය, වල් පැළෑටි ඉවත් කිරීම සහ සුළං බාධක සිටුවීම;

(ඉ) ශ්‍රී ලංකා ප්‍රමිති 1315 ඃ 1 කොටස ඃ 2007, තේ වගාව සඳහා වූ යහපත් කෘෂිකාර්මික පරිචයන්ට අනුකූලව අස්වනු නෙලීම, දළු හැසිරවීම සහ දළු ප්‍රවාහනය සිදු කරනු ලබන්නේ ද යන වග;

(ඊ) සේවා නියුක්තකයන් සඳහා සුදුසු වාසස්ථාන සපයාදීම සහ ඒවා නිසි තත්ත්වයක පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කිරීම;

(උ) අවශ්‍ය අවස්ථාවල දී මාර්ග ඉදිකිරීම සහ ඒවා මනා තත්ත්වයෙන් පවත්වාගෙන යාම;

(ඌ) තේ වගා කිරීම සඳහා නුසුදුසු ප්‍රදේශවල වෙනත් අනුමත භෝග විවිධාංගීකරණය කිරීම් සහ විකල්ප භෝග සඳහා තේ වගාකළ නොහැකි ඉඩම් හඳුනාගැනීම;

(එ) සේවකයන්ගේ හොඳ සෞඛ්‍යය තත්ත්වය සහතික කිරීම, අසනීප සහ තුවාල අවස්ථාවල දී වෛද්‍ය සහාය ලබා දීම.

5. 4 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති කාරණාවලට අදාළව වතු සහ කුඩා වතුවල ලියාපදිංචි අයිතිකරුවන් විසින් වාර්තා පවත්වාගෙන යා යුතු ය.

6. කොමසාරිස්වරයා විසින්, එවැනි සියලු වතු සහ කුඩා වතුවල ලියාපදිංචි අයිතිකරුවන් වෙත කලින් කලට විධාන නිකුත් කළ හැකි වන අතර, එම අයිතිකරුවන් එවැනි විධානයන්ට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

7. වතු සහ කුඩා වතු, නියමිත නිෂ්පාදන සහ කළමනාකරණ ප්‍රමිතියට සංවර්ධනය හෝ නඩත්තු කරනු ලැබ නොමැති බවට කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක දී, එකී වැඩි දියුණු කිරීම් සිදු කරන ලෙසට හෝ එකී අවශ්‍යතාවන් ඉටු කරන ලෙසට කොමසාරිස්වරයා විසින් ලිඛිතව එම වතු හෝ කුඩා වතුවල අයිතිකරුවන් වෙත ලිඛිතව දැනුම් දිය හැකි ය.

8. 7 වන නියෝගයේ විධිවිධාන ප්‍රකාරව කොමසාරිස්වරයා විසින් ලිඛිත දැනුම්දීමක් නිකුත් කරනු ලබන්නේ කවර අයිතිකරුවන් වෙත ද, එම අයිතිකරුවන් විසින් අවස්ථාවෝචිත පරිදි නියමිත නිෂ්පාදන හෝ කළමනාකරණ ප්‍රමිතීන් සමඟ අනුකූල වීම සඳහා වහාම අවශ්‍ය පියවර ගත යුතු ය.

9. මේ නියෝග යටතේ කොමසාරිස්වරයාගේ යම් තීරණයක් මගින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, එවැනි තීරණයක් දැනුම් දීමේ දින සිට දින විසි අටක් ඇතුළත, වැවිලි විෂයය පවරා ඇති අමාත්‍යවරයා වෙත ලිඛිතව අභියාචනය කළ හැකි ය.

10. මෙම නියෝගවල -

"කොමසාරිස්වරයා", "වත්ත" සහ "කුඩා වත්ත" යන්නට 1957 අංක 51 දරන තේ පාලන පනත මගින් ඒවාට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

"ශ්‍රී ලංකා තේ පර්යේෂණ මණ්ඩලය" යන්නෙන්, 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද තේ පර්යේෂණ මණ්ඩලය අදහස් වේ.

EOG 12-0135/2

---

එල්.ඩී.බී. 2/1976 (iv)

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත**

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද නියෝගය.

**ජයම්පති මොල්ලිගොඩ,**
සභාපති,
ශ්‍රී ලංකා තේ මණ්ඩලය.

2020 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2010 දෙසැම්බර් මස 17 වැනි දිනැති අංක 1684/48 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද, 2010 අංක 2 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල (තේ දළුවල තත්ත්ව ප්‍රමිතිය) නියෝග, ඒ යටතේ කරන ලද කිසිවකට අගතියක් නොමැතිව මෙය *ගැසට් පත්‍රයේ* පළ කල දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

EOG 12-0135/3

එල්.ඩී.බී. 44/1957 (iii)

**1957 අංක 51 දරන තේ පාලන පනත**

1957 අංක 51 දරන තේ පාලන පනතේ 11අ, 11ආ, 11ඇ සහ 17 වැනි වගන්ති සමඟ කියවිය යුතු 49 වැනි වගන්තිය යටතේ වැවිලි අමාත්‍යවරයා විසින් සාදන ලද සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද නියෝග.

වෛද්‍ය **රමේෂ් පතිරණ** (පා. ම.),
වැවිලි අමාත්‍ය.

2021 මාර්තු මස 02 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග, 2021 අංක 02 දරන තේ පාලන (අමු තේ දළුවල තත්ත්ව ප්‍රමිතිය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. සියලුම ලියාපදිංචි තේ නිෂ්පාදකයන් සඳහා සහ තේ කර්මාන්තශාලා වෙත අමුද්‍රව්‍යයක් ලෙස තේ දළු සපයනු ලබන බලපත්‍රලාභී වෙළෙන්දන් සඳහා මෙම නියෝග අදාළ වේ.

3. නිමි තේ නිෂ්පාදනය කිරීම සඳහා තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යනු ලබන එකී සෑම නිෂ්පාදකයකු ම,

(අ) තේ නිෂ්පාදනය කිරීමේ දී යොදා ගැනීම සඳහා කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන තත්ත්ව ප්‍රමිතියට අනුකූලව සපයනු ලබන අමු තේ දළු ප්‍රමාණය අවම වශයෙන් සියයට හැටක් (60%) බවට සහතික විය යුතු ය; සහ

(ආ) නිෂ්පාදනය කිරීම සඳහා එසේ සපයනු ලබන අමු තේ දළුවලට එම අමු තේ දළු සැපයුම්කරුවන් විසින් සිදු කරනු ලබන පසු අස්වනු ක්‍රියාවලිය හේතුවෙන් හානියක් නොවන බවට සහතික විය යුතු ය.

4. අමු තේ දළු සපයනු ලබන සෑම බලපත්‍රලාභී වෙළෙන්දකු ම,

(අ) තේ නිෂ්පාදනය කිරීමට යොදා ගැනීම සඳහා කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන තත්ත්ව ප්‍රමිතියට අනුකූලව අවම වශයෙන් අමු තේ දළු සියයට හැටක් (60%) සැපයීමට ප්‍රයත්න දැරිය යුතු ය; සහ

(ආ) අමු තේ දළු හැසිරවීමේ කටයුතු සහ ඒවා කර්මාන්තශාලාව වෙත ප්‍රවාහනය කිරීම, අමු තේ දළුවලට හානි නොවන පරිදි සිදුකරන බව සහතික කර ගැනීම සඳහා පියවර ගත යුතු ය.

5. එකී සෑම නිෂ්පාදකයකු විසින් අවම වශයෙන් සියයට හැටක (60%) තත්ත්ව ප්‍රමිතියෙන් යුත් අමු තේ දළු සැපයීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කළ යුතු අතර, හානි නොවූ අමු තේ දළු අඛණ්ඩව සැපයීම සහතික කර ගැනීම සඳහා සුදුසු යන්ත්‍රණයක් ආරම්භ කළ යුතු ය.

6. නිමි තේ නිෂ්පාදනය කිරීම සඳහා තේ කර්මාන්තශාලාවක් පවත්වාගෙන යනු ලබන එකී සෑම නිෂ්පාදකයකුම සහ යම් කර්මාන්ත ශාලාවක් වෙත අමු තේ දළු සපයනු ලබන සෑම බලපත්‍රලාභී වෙළෙන්දෙකු විසින් ම ගොවිපළේ සිට තේ කර්මාන්තශාලාව වෙත අමු තේ දළු ප්‍රවාහනය කිරීම සඳහා කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද බහාලුම් භාවිත කළ යුතු ය.

7. ලියාපදිංචි තේ නිෂ්පාදකයන්ට අයත් ඔවුන් විසින් පාලනය කරනු ලබන සියලුම තේ කර්මාන්තශාලා සහ අමු තේ දළු සපයනු ලබන බලපත්‍රලාභී වෙළෙන්දන් විසින්, කොමසාරිස්වරයා විසින් කලින් කලට නිකුත් කරනු ලැබිය හැකි විධානයන්ට අනුකූලව කටයුතු කළ යුතු අතර, කොමසාරිස්වයා විසින් නියම කරනු ලබන යම් වාර්තා ද පවත්වාගෙන යා යුතු ය.

8. මෙම නියෝග යටතේ කොමසාරිස්වරයා විසින් ගනු ලබන යම් තීරණයක් මගින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, එම තීරණය දැනුම් දුන් දින සිට දින විසි අටක් ඇතුළත වැවිලි විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා වෙත ලිඛිතව අභියාචනය කරනු ලැබිය හැකි ය.

9. මෙම නියෝගවල "කොමසාරිස්වරයා", "අමු තේ දළු", "නිමි තේ", "නිෂ්පාදකයා", "හිමිකරු", "තේ කර්මාන්තශාලාව" සහ "බලපත්‍රලාභී වෙළෙන්දා" යන්නට 1957 අංක 51 දරන තේ පාලන පනත මගින් ඒවාට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

EOG 12-0135/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.